සවියෙන් පෙරට අපි එකට

e- ඉගෙනුම් පාසල

හොරණ අධ්‍යාපන කලාපය



| ශ්‍රේණිය | විෂයය | වාරය | පාඩම |
| --- | --- | --- | --- |
| 9 | ඉතිහාසය | 2 | 3. ශ්‍රී ලංකාවේ ආගමික හා ජාතික පුනර්ජීවනය |


සැකසුම: දිනූෂා සමරවීර

බප/ හො/ පලන්නොරුව ම. ම. වි.

# ශ්‍රී ලංකාවේ ආගමික හා ජාතික පුනර්ජීවනය යනු

19 වන සියවස අගභාගයේදී ලංකාවේ බෞද්ධ හින්දු හා ඉස්ලාම් ජනතාව තුළ ආගමික හා ජාතික වශයෙන් ඇතිවූ විශාල පිබිදීමකි.

# මිෂනාරී සංවිධාන හා ඒවායේ කටයුතු

## මිෂනාරී සංවිධාන

**ක්‍රිස්තියානි ආගම** ප්‍රචාරය කිරීම සඳහා මෙරට ධර්ම දූත කටයුතුවල නිරත වූ ස්වේච්ඡා සංවිධාන විශේෂයකි.

| | |
|---|---|
| L | ලන්ඩන් මිෂනාරී සමාගම |
| B | බැප්ටිස්ට් මිෂනාරී සමාගම |
| W | වෙස්ලියන් මිෂනාරී සමාගම |
| A | අමෙරිකන් මිෂනාරී සමාගම |
| C | චර්ච් මිෂනාරී සමාගම |

# මිෂනාරී සංවිධාන ක්‍රිස්තියානි ආගම ප්‍රචාරය කිරීමට අනුගමනය කළ ක්‍රියාමාර්ග



# මිෂනාරී කටයුතු සාර්ථක වීමට බලපෑ හේතු

- රාජ්‍ය අනුග්‍රහය ලැබීම
- ආගම ප්‍රචාරය සඳහා අධ්‍යාපනය ලබාදීම
- මුද්‍රණාල ආරම්භ කිරීම
- පොත්පත් ,පුවත්පත් හා සඟරා වැනි ප්‍රකාශන නිකුත් කිරීමට මූල්‍ය පහසුකම් තිබීම
- මිෂනාරීන් සතුවූ සංවිධාන ශක්තිය

# ලාංකිකයන් තුළ ආගමික ප්‍රබෝධයක් ඇතිවීමට බලපෑ හේතු

- මිෂනාරීන්ගේ ආගමික කටයුතු නිසා දේශීය ආගම්වලට පහර වැදීම
- සිංහල හා දෙමළ වැනි ස්වභාෂා අධ්‍යාපනය දියුණු කිරීමට රජය ප්‍රමාණවත් අවධානයක් යොමු නොකිරීම
- බ්‍රිතාන්‍ය පාලනය යටතේ ස්වකීය සංස්කෘතිය විනාශ වෙතැයි හැඟීමක් ස්වදේශිකයන්ට ඇතිවීම

# බෞද්ධ පුනර්ජීවන ව්‍යාපාරය

## බෞද්ධ පුනර්ජීවන ව්‍යාපාරයේ කැපී පෙනෙන ලක්ෂණ

- පිරිවෙන් පිහිටුවීම
- මුද්‍රණාල පිහිටුවීම
- වාදවිවාද පැවැත්වීම
- බෞද්ධ පාසල් පිහිටුවීම
- දේශීය සංස්කෘතිය ආරක්ෂා කරගැනීමට කටයුතු කිරීම

| ලක්ෂණය | උදාහරණ |
| --- | --- |
| පිරිවෙන් පිහිටුවීම | රත්මලානේ පරමධම්මචේතිය පිරිවෙන<br>මාළිගාකන්දේ විද්‍යොදය පිරිවෙන<br>පෑලියගොඩ විද්‍යාලංකාර පිරිවෙන |
| මුද්‍රණාල පිහිටුවීම | මෙරට පළමු මුද්‍රණාලය ලංකෝපකාර මුද්‍රණාලයයි<br>එය පිහිටුවීමට මුල්වූයේ බුලත්ගම ධම්මාලංකාර සිරි සුමනතිස්ස හිමියන්ය<br>මුද්‍රණය වූ ප්‍රකාශන<br>ලක්මිණි පහන<br>සිංහල ජාතිය<br>සරසවි සඳරැස<br>සිංහල බෞද්ධයා |
| වාදවිවාද පැවැත්වීම | පංචමහාවාද පැවැත්වීම<br>බද්දේගම වාදය<br>වරාගොඩ වාදය<br>උදන්විට වාදය<br>ගම්පොළ වාදය<br>පානදුරාවාදය |



| ලක්ෂණය | උදාහරණ |
| --- | --- |
| බෞද්ධ පාසල් පිහිටුවීම | කොළඹ ආනන්ද විද්‍යාලය<br>මහනුවර ධර්මරාජ විද්‍යාලය<br>ගාල්ල මහින්ද විද්‍යාලය<br>නාවලපිටිය අනුරුද්ධ විද්‍යාලය<br>කොළඹ මියුසියස් විද්‍යාලය |
| දේශීය සංස්කෘතිය ආරක්ෂා කරගැනීම | • **D.B.**ජයතිලක - කොළඹ තරුණ බෞද්ධ සංගමය පිහිටුවීම<br><br>•අනගාරික ධර්මපාලතුමා - අමද්‍යප ව්‍යාපාරය<br><br>•වලිසිංහ හරිස්චන්ද්‍ර - අනුරාධපුරයේ නටඹුන්ව ගිය පූජනීය ස්ථාන රැකගැනීම<br><br>•ජෝන් ද සිල්වා<br>•පියදාස සිරිසේන<br>} නාට්‍ය හා නවකතා හරහා දේශීය සංස්කෘතියේ අගය පැහැදිලි කිරීම |

# බෞද්ධ පුනරුදයේ වැදගත් කටයුතු

- බෞද්ධ පාසල් ආරම්භ වීම
- බෞද්ධ දරුවන්ට ඉංග්‍රීසි අධ්‍යාපනය ලබාදීම
- ඉරිදා දහම් පාසල් ආරම්භ වීම
- වෙසක් පෝය නිවාඩු දිනයක් කිරීම
- බෞද්ධ කොඩිය නිර්මාණය කිරීම
- අමද්‍යප ව්‍යාපාරය

# හෙන්රි ස්ටීල් ඕල්කට්තුමා

- බෞද්ධ පාසල් ආරම්භ කිරීම
- ඉරුදින දහම් පාසල් ආරම්භ කිරීම
- වෙසක් පෝය දිනය රජයේ නිවාඩු දිනයක් බවට පත්කිරීම
- බෞද්ධ කොඩිය නිර්මාණය කිරීම
- **පරම විඥානාර්ථ සමාගම** ආරම්භ කිරීම



# අනගාරික ධර්මපාලතුමා

- බෞද්ධ පාසල් පිහිටුවීම
- දේශීය සංස්කෘතිය රැකගැනීමට ක්‍රියා කිරීම
- අමද්‍යප නායකයෙකු ලෙස ක්‍රියා කිරීම
- බුද්ධගයාව ඇතුළු ඉන්දියාවේ පූජනීය ස්ථාන රැකගැනීමට ක්‍රියා කිරීම
- සිංහල බෞද්ධයා පුවත්පත හා මහාබෝධි සගරාව ආරම්භ කිරීම



# හින්දු පුනර්ජීවනය

## අධ්‍යාපනය

### පාසල් පිහිටුවීම

- ශෛව ප්‍රකාශ් විද්‍යාලය
- යාපනයේ ශිවන්ගල විද්‍යාලය
- පරමේශ්වර විද්‍යාලය
- රාමනාදන් විද්‍යාලය

## ලේඛනය

- උදයභානු පුවත්පත
- බාල පාඨම් පෙළපොත් රචනය
- ස්කන්ධ පුරාණම් හා පෙරිය පුරාණම් යන ග්‍රන්ථ දෙමළ භාෂාවට පරිවර්තනය කිරීම

# හින්දු පුනර්ජීවනයට දායක වූවන්



ආරුමුග නාවලර්තුමා



පොන්නම්බලම් රාමනාදන්

# ආරුමුග නාවලර්තුමාගෙන් සිදුවූ සේවාවන්

- ශ්‍රී ලංකාවේ හින්දු ආගමික පුනරුදයට නායකත්වය සැපයීම
- හින්දු පාසල් පිහිටුවීමට පුරෝගාමී වීම
- හින්දු භාෂාව, සාහිතය හා සංස්කෘතිය රැකගැනීමට ක්‍රියා කිරීම
- බාල පාඨම් පෙළපොත් රචනය
- ස්කන්ද පුරාණම් හා පෙරිය පුරාණම් වැනි ග්‍රන්ථ දෙමළ

භාෂාවට පරිවර්තනය කිරීම

# ඉස්ලාම් පුනර්ජීවනය

- අධ්‍යාපනය
  - පාසල් පිහිටුවීම
    - කොළඹ සාහිරා විද්‍යාලය පිහිටුවීම
- ලේඛනය
  - මුස්ලිම් නේසන් සඟරාව ආරම්භ කිරීම



# ඉස්ලාම් පුනර්ජීවනයට දායකවූවන්



ටී .බී. ජයා



සිද්ධි ලෙබ්බේ

# සිද්ධි ලෙබ්බේ මහතා හා ටී. බී .ජයා මහතාගෙන් සිදුවූ සේවාවන්

- ඉස්ලාම් පුනරුදයට නායකත්වය සැපයුවේ **සිද්ධි ලෙබ්බේ** මහතා විසිනි
- ඉස්ලාම් ජනතාව මුද්‍රිත මාධ්‍යයෙන් දැනුවත් කිරීමට **මුස්ලිම් නේසන්** නමින් සගරාවක් ආරම්භ කිරීම
- **කොළඹ සහිරා විද්‍යාලය** පිහිටුවීම
- ටී. බී .ජයා මහතා විසින් කොළඹ සහිරා විද්‍යාලයේ ශාඛා දිවයිනේ විවිධ ප්‍රදේශවල පිහිටුවීමට කටයුතු කිරීම
- සිංහල හා දෙමළ නායකයන් සමග එකතු වී ජාතික සමගිය ගොඩනැගීමට ක්‍රියා කිරීම

**සවියෙන් පෙරට - අපි එකට**
**e-ඉගෙනුම් පාසල**
**හොරණ අධ්‍යාපන කලාපය**

| ශ්‍රේණිය | විෂයය | වාරය | පාඩම |
|---|---|---|---|
| 9 | ඉතිහාසය | 2 | 3. ශ්‍රී ලංකාවේ ආගමික හා ජාතික පුනර්ජීවනය - ඇගයීම |

සැකසුම:දිනූෂා සමරවීර
බප/හො/පලන්නොරුව ම.ම.වි

1. ශ්‍රී ලංකාවේ ආගමික හා ජාතික පුනර්ජීවනය යනු කුමක්ද?
2. මිෂනාරී සංවිධාන යනු මොනවාද?
3. ශ්‍රී ලංකාවට පැමිණි මිෂනාරී සංවිධාන පහක් නම් කරන්න.
4. මිෂනාරීන් ආගම ප්‍රචාරය කිරීමට අධ්‍යාපනය යොදාගත්තේ කෙසේද?
5. ආගම ප්‍රචාරය කිරීම පිණිස ඔවුන් විසින් මුද්‍රණය කළ ප්‍රකාශන තුනක් නම් කරන්න.
6. මිෂනාරී කටයුතු සාර්ථක වීමට බලපෑ හේතු මොනවාද?
7. බෞද්ධ පුනර්ජීවන ව්‍යාපාරයේ කැපී පෙනෙන ලක්ෂණ මොනවාද?
8. පංච මහාවාද නම් කරන්න.
9. පරම විඥානාර්ථ සමාගම පිහිටවූයේ කවුරුන් විසින්ද?
10. එම සමාගමේ මැදිහත්වීමෙන් පිහිටවූ බෞද්ධ පාසල් මොනවාද?
11. හෙන්රි ස්ටීල් ඕල්කට්තුමාගෙන් සිදුවූ සේවාවන් හතරක් ලියන්න.
12. අමද්‍යප ව්‍යාපාරය යනු කුමක්ද?
13. දේශීය සංස්කෘතිය ආරක්ෂා කරගැනීමට කටයුතු කළ පුද්ගලයන් නම් කරන්න.
14. අනගාරික ධර්මපාලතුමාගෙන් ඉටුවූ ජාතික සේවාවන් මොනවාද?
15. හින්දු පුනරුද ව්‍යාපාරයේ කැපී පෙනෙන ලක්ෂණ මොනවාද?
16. හින්දු පුනරුදයට දායකත්වය ලබාදුන් පුද්ගලයන් නම් කරන්න.
17. ආරුමුග නාවලර්තුමාගෙන් හින්දු පුනරුදය වෙනුවෙන් ඉටුවූ සේවාවන් මොනවාද?

18. මෙරට ඉස්ලාම් පුනරුදයට නායකත්වය සපයන ලද්දේ කව්ද?

19. 1883 දී ඉස්ලාම් පුනරුද ව්‍යාපාරයට සහයෝගය දැක්වීමට පැමිණි ඊජිප්තු ජාතිකයා නම් කරන්න.

20. ටී. බී .ජයා මහතා හා සිද්දි ලෙබ්බේ මහතා විසින් ඉස්ලාම් පුනරුදය වෙනුවෙන් කළ සේවාවන් මොනවාද?

**සවියෙන් පෙරට - අපි එකට**

**e-ඉගෙනුම් පාසල**

**හොරණ අධ්‍යාපන කලාපය**

| ශ්‍රේණිය | විෂයය | වාරය | පාඩම |
|---|---|---|---|
| 9 | ඉතිහාසය | 2 | 3. ශ්‍රී ලංකාවේ ආගමික හා ජාතික පුනර්ජීවනය - පිළිතුරු |

සැකසුම:දිනූෂා සමරවීර
බප/හො/පලන්නොරුව ම.ම.වි

1. 19 වන සියවසේ අග භාගයේ දී ලංකාවේ බෞද්ධ , හින්දු හා ඉස්ලාම් ජනතාව තුළ ආගමික හා ජාතික වශයෙන් ඇතිවූ විශාල පිබිදීමකි.

2. ක්‍රිස්තියානි ආගම ප්‍රචාරය කිරීමට පැමිණි විදේශීය ස්වේච්ඡා සංවිධාන

3. i) ලන්ඩන් මිෂනාරි සමාගම
   ii) බැප්ටිස්ට් මිෂනාරි සමාගම
   iii) වෙස්ලියන් මිෂනාරි සමාගම
   iv) අමෙරිකන් මිෂනාරි සමාගම
   v) චර්ච් මිෂනාරි සමාගම

4. i) මිෂනාරීන් සිංහල හා දෙමළ භාෂා ඉගෙනගෙන ගම්බද පාසල්වල දේශීය භාෂාවෙන් ඉගැන්වීම
   ii) නගරබද පාසල්වල ඉංග්‍රීසි භාෂාවෙන් ඉගැන්වීම
   iii) ඉංග්‍රීසි භාෂාවෙන් අධ්‍යාපනය ලැබූ අයට රජයේ තනතුරු ලබාදීම
   iv) මිෂනාරි පාසල් ආරම්භ කිරීම

5. මාසික තෑග්ග, උරගල, ලංකා නිධානය

6. i) රාජ්‍ය අනුග්‍රහය ලබාදීම
   ii) ආගම ප්‍රචාරය සඳහා අධ්‍යාපනය යොදාගැනීම
   iii) මුද්‍රණාල ආරම්භ කිරීම
   iv) පොත්පත්,පුවත්පත් හා සඟරා වැනි ප්‍රකාශන නිකුත් කිරීමට මූල්‍ය පහසුකම් තිබීම
   v) මිෂනාරීන් සතුවූ සංවිධාන ශක්තිය

7. i) පිරිවෙන් පිහිටුවීම

ii) මුද්‍රණාල පිහිටුවීම හා මුද්‍රිත මාධ්‍ය යොදාගැනීම

iii) වාදවිවාද පැවැත්වීම

iv) බෞද්ධ පාසල් පිහිටුවීම

v) දේශීය සංස්කෘතිය ආරක්ෂා කර ගැනීමට කටයුතු කිරීම

8. i) බද්දේගම වාදය

ii) උදන්විට වාදය

iii) පානදුරාවාදය

iv) වරාගොඩ වාදය

9. හෙන්රි ස්ටීල් ඕල්කට්තුමා විසින්

10.i) කොළඹ ආනන්ද විද්‍යාලය

ii) මහනුවර ධර්මරාජ විද්‍යාලය

iii) ගාල්ල මහින්ද විද්‍යාලය

iv) නාවලපිටිය අනුරුද්ධ විද්‍යාලය

v) කොළඹ මියුසියස් විද්‍යාලය

11. i) බෞද්ධ පාසල් අරමුදලක් පිහිටුවීමට පුරෝගාමී වීම

ii) ඉරුදින දහම් පාසල් ඇරඹීම

iii) වෙසක් පෝය දිනය රජයේ නිවාඩු දිනයක් බවට පත්කිරීම

iv) බෞද්ධ කොඩිය නිර්මාණය කිරීම

12. දේශීය ජනතාව මධ්‍යසාර පානයට හුරුවීම වළක්වාගැනීමට ආරම්භ කරන ලද්දකි.

13. අනගාරික ධර්මපාලතුමා, වලිසිංහ හරිස්චන්ද්‍ර මැතිතුමා

පියදාස සිරිසේන මහතා, ජෝන් ද සිල්වා මහතා

14. * බෞද්ධ පාසල් පිහිටුවීමට කටයුතු කිරීම
* දේශීය සංස්කෘතිය රැකගැනීමට ක්‍රියා කිරීම
* ලාංකිකයන් මධ්‍යසාර පානයෙන් මුදවාගැනීමට අමද්‍යප නායකයෙකු වශයෙන් කටයුතු කිරීම
* බුද්ධගයාව ඇතුලු ඉන්දියාවේ පූජනීය ස්ථාන රැකගැනීමට ක්‍රියා කිරීම
* සිංහල බෞද්ධයා පුවත්පත හා මහාබෝධි සගරාව වැනි ප්‍රකාශන ආරම්භ කිරීම

15. * මුද්‍රණාල පිහිටුවීම

*මුද්‍රිත පොත්පත් හා ප්‍රසිද්ධ දේශන මගින් හින්දු ජනතාව දැනුවත් කිරීම

* නව පාසල් පිහිටුවීම

16. ආරුමුග නාවලර්තුමා, පොන්නම්බලම් රාමනාදන්, පොන්නම්බලම් අරුණාචලම්

17. * ශ්‍රී ලංකාවේ හින්දු ආගමික පුනරුදයට නායකත්වය සැපයීම

හින්දු පාසල් පිහිටුවීමට පුරෝගාමී වීම

* හින්දු භාෂාව , සාහිත්‍ය හා සංස්කෘතිය රැකගැනීමට ක්‍රියා කිරීම

* බාල පාඨම් නම් පෙළපොත් රචනය

* ස්කන්ධ පුරාණම් හා පෙරිය පුරාණම් වැනි ග්‍රන්ථ දෙමළ භාෂාවට පරිවර්තනය කිරීම

18. ඇම්. සී. සිද්දි ලෙබ්බේ මහතා

19. ඔරබි පාෂා

20. * මුස්ලිම් නේසන් නමින් සගරාවක් ආරම්භ කිරීම

* කොළඹ සහිරා විද්‍යාලය ආරම්භ කිරීම

* එහි ශාඛා දිවයිනේ විවිධ ප්‍රදේශවල පිහිටුවීම

* සිංහල හා දෙමළ නායකයන් සමග එකතු වී ජාතික සමගිය

ගොඩනැගීමට ක්‍රියාකිරීම